**ශීර්ෂය 309 - ගොඩනැගිලි දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 309 - ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) තැන්පතු

තෙවන පාර්ශවයන් වෙත ගෙවීමට ඇති මුදල් වශයෙන් පවත්වාගෙන යනු ලබන 13/52 පොදු තැන්පතු ගිණුමේ ශේෂය වන රු.1,014,524,420 ක් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | මුදල් රෙගුලාසි 571 (3) ප්‍රකාරව කල් ඉකුත් වූ සියළුම තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දිනට නිම කළ, අත්හිටවූ සහ ප්‍රමාද වූ කොන්ත්‍රාත්තු සඳහා ලද තැන්පත් රු.1,014,524,420 ක් වූ මුදල් වසර 05ට වඩා වැඩි තැන්පතු රු. 16,870,929 ක් ද, වසර 02ත් 05ත් අතර තැන්පතු රු. 298,581,860 ක් ද පැවතුණි. 13/52 තැන්පත් ගිණුමෙහි මෙම සියලු තැන්පතු ලද දිනය 2022 ජනවාරි 01 ලෙස සටහන් කර තිබුණද එම ශේෂයන්හි නිවැරදි තැන්පත් දිනයන් වසර කිහිපයකට පෙර ඒවා බව නිරීක්ෂණය විය. | වැඩ අවසන් හා වැඩ නවතා ඇති බවට තහවුරු කරන ලද ව්‍යාපෘතිවල ශේෂයන් සේවාදායක ආයතන වෙත යැවීම සඳහා භාණ්ඩාගාරයෙන් අක්මුදල් ඉල්ලා ඇත. සත්‍ය තැන්පත් දිනයන් ඇතුළත් කිරීමේදී පැවැති පද්ධතිමය ගැටළු මත සිගාස් වැඩසටහනට දත්ත ඇතුළත් කිරීමේදී යාවත්කාලීන කරන ලද දින ඇතුළත් කරන ලදී. | නිවැරදි තැන්පත් දිනයන් සටහන් කිරීමටත්, වැඩ අවසන් සහ අතරමඟ නතරකරන ලද ව්‍යාපෘතිවල තැන්පතු ශේෂයන් නිරවුල් කිරීමටත්, අනෙකුත් කල් ඉකත් වූ තැන්පතු මුදල් රෙගුලාසි ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැර කිරීමටත් කටයුතු කළ යුතු බව. |
| **(ii)** | මුදල් රෙගුලාසි 571 (1) ප්‍රකාරව, සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම, ඉකුත් වූ සියළු තැන්පතු පිළිබඳව ලැයිස්තු පිළියෙල කළ යුතු වුව ද එබඳු ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. | මු.රෙ.571 ප්‍රකාරව විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම ඉකුත් තැන්පතු පිළිබඳ ලැයිස්තු පිළියෙල කිරීමට සටහන් කර ගතිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉකුත් වූ සියළු තැන්පතු පිළිබඳ නිවැරදි තොරතුරු ඇතුළත් ලැයිස්තුවක් පිළියෙල කළ යුතුය. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | මූල්‍ය ප්‍රකාශනයේ ACA –6 ආකෘතියේ සහ භාණ්ඩාගාර SA-82 ආකෘතියේ සඳහන් මූල්‍ය නොවන වත්කම් වර්ග 10 ක 2021 දෙසැම්බර් 31 දිනට වූ ශේෂයන්ගේ එකතුව රු.309,229,711 ක් වූ අතර 2022 ජනවාරි 01 දිනට එම ශේෂයන්ගේ ආරම්භක ශේෂවල එකතුව රු. 372,890,462 ක් වූයෙන් 2022 මූල්‍ය ප්‍රකාශනයන්හි ආරම්භක ශේෂයන්ගේ රු. 63,660,751 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. මෙම මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂයන්ට කළ ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | හා.ගා 66 සමඟ සැසඳීමේදී සිගාස් පද්ධතිය වෙත ඇතුළත් නොවූ භාණ්ඩ ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව තක්සේරු මණ්ඩලයක් මඟින් එසේ ඇතුළත් නොවූ වත්කම් මිල තීරණය කොට කලාප කාර්යාලවල සිගාස් පද්ධතියට, එහි දත්ත සටහන් කරනු ලබන ක්‍රමවේදය වන Add Opening Balance ලෙස ඇතුළත් කරන ලදී. | පෙර වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල අවසන් ශේෂයන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් සමඟ සැසඳිය හැකි අයුරින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු බව. |
| **(ii)** | වත්කම් හඳුනා ගැනීම, ගිණුම්ගත කිරීම හා පාලනය පහසුවීම පිණිස මූල්‍ය නොවන වත්කම් වෙනුවෙන් දෙපාර්තමේන්තු අංකන ක්‍රමයක් අනුගමනය කළ යුතු වේ. දෙපාර්තමේන්තුවේ සිගාස් වැඩසටහන මඟින් ජනනය වන වත්කම් ලැයිස්තුවේ ඇති වත්කම් සත්‍ය වශයෙන්ම ආයතනය සතුව භෞතිකව පවතින වත්කම් ද යන්න නිශ්චිතව තහවුරු කර ගැනීමට යම් කේත ක්‍රමයක් භාවිතාකර නොතිබුණි. | අප දෙපාර්තමේන්තුවේ සියළුම වත්කම් සිගාස් පද්ධතියේ ඇතුලත්ව නොතිබූ බැවින්ද නිසි වර්ගීකරණයක් නොවූ බැවින්ද අප විසින් වත්කම් අංක කිරීමක් කර නොතිබුණි. මේ වන විට වත්කම් නිවැරදිව වර්ග කර සිගාස් පද්ධතිය නිසි ආකාරයෙන් සැකසීම ආරම්භව ඇත. | මූල්‍ය නොවන වත්කම් ගිණුම් තැබීමේදී වෙන්කර හඳුනාගත හැකි පරිදි කේත අංකයක් යොදාගත යුතුය. |

## (ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පසුගිය වර්ෂ 06 කට අදාළව ආයතනය විසින් ඉටු කිරීමට ව්‍යාපෘති 451 ක් භාර ගෙන තිබූ නමුත් කොන්ත්‍රාත් ලේඛනයේ කාර්යය නිම කළ දිනය යොදා යාවත්කාලීන කර නොතිබීමෙන් එම කාර්යයන් නිම කර තිබේද යන්න තහවුරු කර ගැනීමට නොහැකි වී තිබුණි. | ප්‍රධාන කාර්යාලයේ කොන්ත්‍රාත්තුවට අදාළ ප්‍රසම්පාදන කටයුතු හා කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කිරීම දක්වා වූ තොරතුරුද අදාළ කාර්යය අවසන් කිරීම දක්වා වූ තොරතුරු ව්‍යාපෘතිය අයත් කලාප කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන ලිපිගොනුවලද අඩංගු වේ. | සියළුම කොන්ත්‍රාත්වල වර්තමාන තත්ත්වය දැක්වෙන පරිදි ප්‍රධාන කාර්යාලයේ කොන්ත්‍රාත් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා ගත යුතු බව. |

## (ඇ) විගණන සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනයන්හි මූල්‍ය නොවන වත්කම් යටතේ දැක්වෙන නිලනිවාස, වාසස්ථාන නොවන ගොඩනැගිලි, වෙනත් ව්‍යුහයන් සහ නොනිමි වැඩ හා ව්‍යුහයන් එකතුව රු. 258,272,189 ක්ද ප්‍රවාහන උපකරණ, වෙනත් යන්ත්‍ර හා උපකරණ සහ වෙනත් මූල්‍ය නොවන අස්පෘශ්‍ය වත්කම් එකතුව රු. 121,561,670 ක් ද රු. 461,298,859 ක් වටිනා ඉඩම්ද සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොවීම හේතුවෙන් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය. | SA-82 ආකෘතියේ දෘඩ පිටපත ලබා දී ඇති අතර එහි විස්තරාත්මක උපලේඛණයේ මෘදු පිටපත් ඔබගේ ඉල්ලීම මත ලබා දී ඇත. මුද්‍රිත ලබාගැනීමේදී විශාල කඩදාසි ප්‍රමාණයක් වැය වන බැවින් දෘඩ පිටපත් ඇමිණීම වෙනුවට මෘදු පිටපත් ඔබ වෙත ලබා දීම සිදු කොට ඇත. | මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්වෙන වත්කම් අයිතම් වෙන් වෙන් වශයෙන් පැහැදිලිව හඳුනා ගත හැකි පරිදි ප්‍රමාණාත්මක විස්තර ඇතුළත් උපලේඛණ සකස්කර ඉදිරිපත් කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම අනුව මියගිය නිලධාරියෙකුගෙන් අය විය යුතු රු.170,275 ක ණය ශේෂය වර්ෂ 2 – 3 අතර කාල පරාසයක පැවතුණු අතර විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් අය විය යුතු රු. 115,861 ක ණය ශේෂය වර්ෂ 05 ට වැඩි කාලයක් ගතව තිබුණද අයකරගෙන නොතිබුණි. | රු.170,275 ක් වන වර්ෂ 2-3 කාල පරාසයක ණය ශේෂය හිමි, මිය ගිය නිලධාරී මහත්මියගේ ස්වාමිපුරුෂයා ද මියගොස් ඇති අතර දරුවන් ද නොමැති බැවින් හිඟ ණය ශේෂය අයකර ගැනීමේ අවශ්‍යතාවය මත, එය මරණ පාරිතෝෂිතයෙන් අයකර ගැනීම යළිත් සලකා බැලීමට අදාළ ලිපි ලේඛන නැවත විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත යවා ඇති අතර එහි අදාළ කටයුතු සිදුවෙමින් පවතී. | සුදුසු පරිදි ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළව සේවය අතහැර ගොස් සිටි නිලධාරීන් දෙදෙනෙකුට අදාළ මාස 03 – 12 අතර කාලයක් හිඟ හිටි ණය ශේෂය රු. 441,095 ක් වූ අතර මාස 03ට අඩු ලැබිය යුතු ණය ශේෂය රු. 242,547 ක් විය. | සේවය අතහැර ගොස් සිටින මාස 03-12 කාල පරාසයට අයත්වන හිඟ ණය රු.441,095 සැකසී ඇත්තේ නිලධාරීන් දෙදෙනෙකුගේ රු.232,650 ක් සහ රු.208,445 ක් වූ ණය ශේෂයන් ලෙසය. හිඟ ණය ඔවුන්ගේ ඇපකරුවන් වෙතින් අයකිරීමට කටයුතු කර ඇති අතර 2023.04.30 වන විට තව දුරටත් අයකළ යුතු හිඟ ණය ශේෂය රු.225,225 ක් වේ. | සියලුම ණය ශේෂ ඇපකරුවන් මඟින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

**නිරීක්ෂණය**

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| (i) | XIX පරිච්ඡේදයේ 6.1 වගන්තිය | - යම් කිසි තනතුරකට වෙන්කරන ලද නිවාස හැර අනෙකුත් සියළුම නිවාසවල බදු කාලය වර්ෂ 05ක් විය යුතු වුවත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් එම විධිවිධාන නොතකා නිවාසවල වර්ෂ 05 කට වඩා වැඩි කාලසීමාවක් නේවාසිකව සිටීම. | උපලේඛණගත නිවාසයන්හි අදාළ නිළධාරීන් තනතුර දරන තාක් පදිංචිව සිටී.එසේම ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 6.12 වගන්තිය අනුව නිවාස වෙන්කර දෙන බලධරයාගේ අනුමැතිය යටතේද නිලධාරීන් වසර 05 කට ඔබ්බෙන් රැඳී සිටී. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව නිවාස වෙන්කර දෙන බලධරයාගේ අනුමැතිය ලබාගැනීමෙන් පසු නේවාසික කාලය දීර්ඝ කළ යුතුය. |
| (ii) | XIX පරිච්ඡේදයේ 6.1.1 වගන්තිය | - පදිංචිය සඳහා අවසර දී ඇති සම්පූර්ණ කාල සීමාවෙන් අඩකට වැඩි කාලයක් තුළ එක් සේවා ස්ථානයක පිහිටි රජයේ නිවාසයක පදිංචිව සිටීමේ වරප්‍රසාද භුක්තිවිඳ ඇති නිලධාරියෙකු, එසේ කලින් පදිංචිව සිටි කාලය අවසන් කළ දිනයේ සිට වර්ෂ 05ක් ගතවන තුරු එම සේවා | මේ වන විට එම නිලධාරීන්ගෙන් නිවාස ලබා ගෙන වෙනත් නිළනිවාස ලබා දී ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ස්ථානයේම පිහිටි එකී නිවාසයක් සඳහා සලකා බැලීමට නුසුදුස්සෙකු ලෙස දක්වා තිබුණද නිලධාරීන් එම විධිවිධානයට පටහැනිව ක්‍රියා කර තිබුණි. | | |
| (ආ) | හාණ්ඩාගාර ලේකම්ගේ අංක MF/CG/02/(iv) හා 2017.06.28 දිනැතිව නිකුත් කරන ලද වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛ අංක 01/2017 | - | | | |
| (i) | 05 වන වගන්තිය | - | ආයතනය සතු රු. 151,620,000 ක් වටිනාකමැති රථ වාහන පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර නොතිබුණි. | චක්‍රලේඛය ඉදිරිපත් නොවූ බැවින්ද අවශ්‍ය වුව හොත් චක්‍රලේඛයක් එවන බව දැන්වූ හෙයින් යැවීමට කටයුතු නොකරන ලදී. | චක්‍රලේඛය ප්‍රකාරව රථ වාහන පිළිබඳ තොරතුරු වාර්තා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 07 වන වගන්තිය | - | කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත කාර්තුමය වශයෙන් වත්කම් මිළදීගැනීම් හා අපහරණයන් වාර්තා කළ යුතු වුවත් එම විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. | මිලදී ගැනීම් හා අපහරණයන් පිළිබඳ කාර්තුමය වාර්තා ඉදිරිපත් කිරීම අතපසු වී ඇත. ඉදිරියේදී යාවත්කාලීන කර එම වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු යොදනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව කාර්තුමය වාර්තා යැවීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

මුදල් රෙගුලාසි 789 ප්‍රකාරව සාමාන්‍ය නියමය වනුයේ රජයේ සියළුම නිර්මාණ හා වැඩ ක්‍රියාත්මක කිරීම පිළිබඳව රජයේ වැඩ දෙපාර්තමේන්තුව (ගොඩනැගිලි දෙපාර්තමේන්තුව) වගකිව යුතු බවයි. මෙම කාර්යයන් හා අනෙකුත් ඉදිකිරීම් කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව සතුව 2022 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ ඉංජිනේරුවන් 78 ක්ද, ජ්‍යෙෂ්ඨ මට්ටමේ ගෘහ නිර්මාණ ශිල්පීන් 13 ක්ද ඇතුළුව සැලසුම් ශිල්පීන්, ප්‍රමාණ සමීක්ෂකයින් හා තාක්ෂණික නිලධාරීන් 210 කින් ද සමන්විත කාර්යමණ්ඩලයක් අනුයුක්ත කර තිබුණි.

### 3.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපොළ විවිධාංගීකරණ අමාත්‍යාංශය කම්කරු අමාත්‍යාංශ ගොඩනැගිල්ලට රැගෙන යාම සඳහා කොන්ත්‍රාත්කරුවකු තෝරා ගෙන තිබුණද එකඟතා ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. කොන්ත්‍රාත්කරුව නිම කර භාර දිය යුතු දිනය ඉක්මවා යන තුරුම විටින් විට කොන්ත්‍රාත්තුවෙහි ඇස්තමේන්තුගත අගයන් වෙනස් කර තිබුණි. මේ හේතුවෙන් අදාළ කාර්යයන් ඉටුකිරීම ප්‍රමාද වී තිබූ බව නිරීක්ෂණය විය. | මෙම කොන්ත්‍රාත් මුදල සම්පූර්ණ වැඩ ඇස්තමේන්තුව ඉක්මවන බැවින් ඒ පිළිබඳව සේවාදායක වෙත දැනුම් දෙන ලදී. තවදුරටත් වියදම් පාලනය කිරීම සඳහා එම අමාත්‍යාංශයේ ඒ වන විට ස්ථාපිත කර තිබූ බෙදුම් ඇදි අවශ්‍ය වෙනස්කම් කර සවි කිරීමටත් තීරණය කරන ලදී. ඒ අනුව ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුව අනුව කාර්යය ඉටුකළ නොහැකි නිසා මෙම කොන්ත්‍රාත්තුව අවලංගු කරන ලදී. ඉන්පසු පවතින භාණ්ඩ භාවිතා කරමින් බෙදුම් ඇදි සවිකල හැකි අයුරින් සැලසුම් සකස් කර නව මිල ගණන් කැඳවා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. | ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී හා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු වටිනාකම රු.9,146,500 ක් වූ කළුතර කර්මාන්තපුරයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් වෙනුවෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පළමු ගෙවීම ලෙස 2021 | මෙම ව්‍යාපෘතියේ මූලික පිරිවැය ඇස්තමේන්තුව 2018/10/15 දින සේවාදායක ආයතනය වෙත යොමු කර, 2019/08/08 දින ඇස්තමේන්තුව අනුමත කර,සේවායෝජිත ආයතනය මගින් 2021/06/30 දින | මු.රෙ. 787 ප්‍රකාරව දෙපාර්තමේන්තුව භාරගනු ලබන ඉදිකිරීම් කොන්ත්‍රාත් අප්‍රමාදව නියමිත කාලපරිච්ඡේදය තුළ නිම කිරීමට සැලසුම්ගතව කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේදී රු.6,198,260 ක් ගෙවා තිබුණි. ඉතා දීර්ඝ කාලයක් ගත කර කොන්ත්‍රාත්තුව 2022 වර්ෂයේදී උප කොන්ත්‍රාත්කරුවෙකු වෙත ප්‍රදානය කර තිබූ නමුත් කොන්ත්‍රාත්තුව අත්හැර දමා තිබුණු අතර ඒ සඳහා අදාළ ඉදිකිරීම් කාර්යය පිරිනැමූ ආයතනයෙහි එකඟත්වයක්ද නොවීය. | චෙක්පතක් මගින් පළමු ගෙවීම රු.6,198,260ක මුදලක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇත. පසුව ප්‍රසම්පාදන කටයුතු සිදු කර 2022/12/22 දින මෙම ව්‍යාපෘතිය කොන්ත්‍රාත්කරු වෙත රු.මිලියන 9.8 ට ප්‍රදානය කරන ලදී. එහෙත් ඒ වන විට රටේ පැවති ආර්ථික අස්ථාවරත්වය නිසා අමුද්‍රව්‍ය මිල අසාමාන්‍ය ලෙස ඉහළ යෑමෙන් මිල විචලනය ඇස්තමේන්තුව ඉක්මවා යාමත්, අමුද්‍රව්‍ය හිගය හා ඉන්ධන හිඟය නිසා කොන්ත්‍රාත්තරු වැඩ කිරීමට නොහැකි බව දන්වා සිටින ලදී. | |
| (ඇ) | ඇස්තමේන්තුගත වටිනාකම රු.156,267,463 ක් වූ කුරුඳුවත්ත පොලිසියේ තනිකඩ හට නිවාසය ඉදිකිරීම, මහඔය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ ගොඩනැගිල්ල ඉදිකිරීම සහ දේශීය ආදායම් දෙපාර්තුමේන්තුවට විදුලි උත්පාදන යන්ත්‍ර හා වායු සමීකරණ යන්ත්‍ර සපයා සවි කිරීම යන කොන්ත්‍රාත් 03 ක් වෙනුවෙන් වූ ඇස්තමේන්තුගත මුදලින් කොටස් මුදල් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ලබාගෙන දීර්ඝ කාලයක් ගතකර තිබුණද ව්‍යාපෘති සම්පූර්ණ කර නොතිබුණි. වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ භාණ්ඩාගාරයෙන් මුදල් නොලැබීම හා කොන්ත්‍රාත්කරුට මුදල් නොගෙවීම මත එම කොන්ත්‍රාත් තුනම අත්හිටුවා තිබුණි. | කුරුඳුවත්ත පොලිසියේ තනිකඩ හට නිවාසය ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව වසර 05 කට අධික කාලයක සිට නිම කිරීමට නොහැකි වී තිබුණේ සේවාදායකයා විසින් ව්‍යාපෘති ගිවිසුමට අනුකූලව ගොඩනැගිලි පරිශ්‍රය භාර නොදීමත්, ඉදිකිරීම් කටයුතුවලට අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සපයා නොදීමත් නිසාවෙනි.<br><br>මහඔය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2017 හා 2018 වර්ෂවල සිදුකරන ලද කාර්යයන් සඳහා වූ බිල්පත් පියවා ඇත. ඉන් පසුව 2020 වර්ෂය සඳහා ප්‍රතිපාදන ලැබී නොමැත. පොදු එකඟතාවය මත කොන්ත්‍රාත්තුව අවලංගු කිරීම සඳහා ඉල්ලීමක් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර ඇත.<br><br>තවද, දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට විදුලි | මු.රෙ. 787 ප්‍රකාරව දෙපාර්තමේන්තුව භාරගනු ලබන ඉදිකිරීම් කොන්ත්‍රාත් නියමාකාරයෙන් අධීක්ෂණය කර නිසි කාලපරිච්ඡේදයක් තුළ ප්‍රමාණවත් කාර්යසාධනයක් අත්පත් කරගැනීමට කටයුතු කළ යුතු බව.<br><br>මු.රෙ. 705 ප්‍රකාරව යුතුකම් පැහැර හරින කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් ක්‍රියා කර ඒ අනුව සුදුසු තීරණවලට එළඹිය යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | | උත්පාදන යන්ත්‍ර හා වායුසමීකරණ යන්ත්‍ර සපයා සවිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2021/08/18 දින ප්‍රදානය කරන ලද අතර එය 2022 දෙසැම්බර් නිම කිරීමට නියමිතව තිබුනි. උපාංග ආනයනය සඳහා සියයට 87 ක මිල විචලනයක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කරන ලද අතර මෙම කොන්ත්‍රාත්තුව 2023 අප්‍රේල් මස අවලංගු කරන ලදි. | |
| (ඇ) | වර්ෂ 2018 සිට 2021 දක්වා ගිවිසුම් ගත වූ කයිතඩි ආර්යුවේද රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිළධාරි විවේකාගාරය ඉදිකිරීම, වැල්පොතුවැව කොබෙයිගනේ මධ්‍යම බෙහෙත් ශාලාව ඉදිකිරීම, කරයිතිවු ප්‍රධාන මාර්ගයේ දොරටු ඉදිකිරීම සහ වරකාපොළ කම්කරු කාර්යාල ඉදිකිරීම යන ව්‍යාපෘති සඳහාද ගිවිසුම් ගත වී දීර්ඝ කාලයක් තුළ ඉටු නොකර තබා ගනිමින් පසුව ජාතික අයවැය චක්‍රලේඛ 03/ 2022 ප්‍රකාරව 2022 වර්ෂයේදී අත්හිටුවා තිබුණි. | **කයිතඩි ආයුර්වේද රෝහල ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව** ඉදිකිරීම් ද්‍රව්‍යවල හිඟතාවය සහ ආනයනික ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල ඉහළ යාම නිසාද, වැල්පොතුවැව මධ්‍යම බෙහෙත් ශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම - අදියර 11 දිගින් දිගටම කොන්ත්‍රාත්කරු සංවර්ධන කටයුතු පැහැර හැරීම නිසාද, කරයිතිව් ප්‍රධාන මාර්ගයේ දොරටුව ඉදිකිරීම සඳහා වූ ව්‍යාපෘතියේ වැඩ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2020 දී කරන ලද දැනුම් දීම අනුවද, වරකාපොළ කම්කරු කාර්යාලයේ ඉදිකිරීම 2022.03.22 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කල නමුත් කොන්ත්‍රාත් ආයතනය විසින් සේවය ඉටු නොකිරීම මතද, අවසන් කර ඇත. | ගිවිසුම්ගත වී දීර්ඝ කාලයක් ගතවුවද ඉදිකිරීම් ආරම්භ නොකිරීම සම්බන්ධයෙන් මු.රෙ.705 ප්‍රකාරව යුතුකම් පැහැර හරින කොන්ත්‍රාත්කරුවන් යටතේ ක්‍රියාකිරීමට කටයුතු කළ යුතු අතර අදාල අධිකාරින්ගෙන් නියමිත කාලවකවානු තුලදී අවශ්‍ය අනුමැතීන් ලබාගෙන ව්‍යාපෘති ඉටුකල යුතු බව. |
| (ඉ) | රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන විසින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පූර්ව වසර 05 ක් තුල පිරිනමන ලද රුපියල් මිලියන 659 ක් ඉක්මවූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 23 ක් නිමකිරීමකින් තොරව අතරමග නවතා දමා තිබුණි. | මෙයින් ව්‍යාපෘති 20 ක්ම අමාත්‍ය මණ්ඩල තීරණ යටතේ අර්ධ රාජ්‍ය ආයතනයක් වන ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය ගොඩනැංවීමේ අරමුණින් එම ආයතනය වෙත වෙත ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් වේ. වර්තමානයේදී ද ලබා දෙන ලද | මු.රෙ. 705 ප්‍රකාරව යුතුකම් පැහැර හරින කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු බව හා ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට පෙර ශක්‍යතා අධ්‍යානයකින් ව්‍යාපෘති ඉටු කළ හැකිද යන්න තහවුරු කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කොන්ත්‍රාත් සම්බන්ධයෙන් සැපයුම්කරුවන්ට හා ශ්‍රම කොන්ත්‍රාත් සඳහා ගෙවීම් නොකිරීම නිසාත් ඒ සඳහා ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය මැදිහත් නොවීම නිසාත් සමහර ව්‍යාපෘති පිළිබඳව කටයුතු කිරීමට නොහැකි වී ඇත.ඉතිරි කොන්ත්‍රාත් තුන කොන්ත්‍රාත්කරුවන් විසින් කොන්ත්‍රාත්තුවට අනුව වැඩ නොකිරීම, සේවාදායක ආයතනය විසින් මුදල් වෙන්කර නොතිබීම, ව්‍යාපෘතිය අදාළ වැඩබිමේ ඉටුකිරීමට නොහැකි වීම යනාදී හේතු නිසා අතහැර දමා ඇත. | |

### 3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2018 අගෝස්තු 15 දිනැති බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනත අනුව සභාධිපත්‍ය දේපල පදිංචිය සඳහා ආරක්ෂිත බවට පරීක්ෂා කර සහතික නිකුත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානය වන විට නිවාස ඒකක 36ක් භෞතිකව පරීක්ෂා කර නොතිබුණු අතර ඒකක 710ක පරීක්ෂණ කටයුතු නිම කර තිබුණද සහතික නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 මැයි 25 වන දිනට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් ලැබුනු ව්‍යාපෘති 23න් 16ක වාර්තා මේ වන විට නිකුත්කර ඇත.කොවිඩ් වසංගතය යම් තරමකට නිම වූ පසුව නැවත නිලධාරීන් පරීක්ෂාව සඳහා යෙදවූ අතර එම වාර්තාව මේ දිනවල සකස් කරමින් පවතී.<br><br>අනිකුත් රජයේ ආයතන වලට අයත් ව්‍යාපෘති 05ක වාර්තා මේ වන විට නිකුත් කර ඇත.ඉතිරි ව්‍යාපෘති 05ක පරීක්ෂා කිරීමට අවශ්‍ය සැලසුම් හා අනෙකුත් ලිපි ලේඛන මේ වන විට ඉල්ලා යවා ඇත. | පනත ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු තම කාර්යයන් කඩිනමින් අවසන් කර නිසි කාර්යය සාධනයක් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ii) | කාර්යසාධන වාර්තා අනුව 2022 වර්ෂයේ පූර්ණ ව්‍යාපෘති (Turnkey) 98ක් ලැබී තිබුණද ඉන් ව්‍යාපෘති 07ක කිසිඳු කාර්යයක් සිදු කර නොතිබුණු අතර වාර්ෂික ප්‍රතිපාදනය | 2022 වර්ෂයේ ලැබී තිබුණු ව්‍යාපෘති 98න් කිසිදු කාර්යයක් සිදු කර නොතිබුණු ව්‍යාපෘති 07න් ව්‍යාපෘති 02ක් අවසන් කර (Terminate) ඇති අතර ව්‍යාපෘති 03ක් සඳහා ප්‍රතිපාදන නොමැත.එක් ව්‍යාපෘතියක් | ව්‍යාපෘති සැලසුම් කළ පරිදි ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට හා නිසි කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට දෙපාර්තමේන්තුවේ කළමණාකරණය කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | රු.මිලියන 294.82ක් වූ ව්‍යාපෘති 11ක භෞතික ප්‍රගතිය සියයට 02 ත් සියයට 50 ත් අතර පරාසයක පැවතුණි. | අදාළ සේවාදායක ආයතනය මගින් නැවත ටෙන්ඩර් කැඳවා ඇත.ඉතිරි ව්‍යාපෘතිය අත්හිටුවීම සඳහා ලිපි ඉදිරිපත් කර ඇත.<br><br>වාර්ෂික ප්‍රතිපාදනය රු. මිලියන 294.82ක් වූ ව්‍යාපෘති 11න් ව්‍යාපෘති 05ක් 2023 වසරේ මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින අතර එම ව්‍යාපෘතීන්හි සමුච්චිත ප්‍රගතිය සියයට 12, 37, 51, 74, සහ සියයට 79 ලෙස වේ. ව්‍යාපෘති 06ක් සඳහා මෙතෙක් ප්‍රතිපාදන ලැබී නොමැත. | |
| (iii) | විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2022 වර්ෂයේ උපදේශාත්මක (Consultancy) සේවා සැපයීම සඳහා ටෙන්ඩර් 25ක් ලැබී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එයින් ව්‍යාපෘති 04ක් ආරම්භ කර නොතිබුණි. වාර්ෂික ප්‍රතිපාදනය රු.මිලියන 431.82ක් වූ ව්‍යාපෘති 10ක භෞතික ප්‍රගතිය සියයට 03 සිට සියයට 45 දක්වා පරාසයක පැවතුණි. | 2022 වර්ෂයේ උපදේශාත්මක ව්‍යාපෘති 33ක් ලැබී තිබුණු අතර ඉන් කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණු ව්‍යාපෘති 03 ක ටෙන්ඩර් කැඳවීමේ කටයුතු අවසන් කාර්තුවේ සිදු කරනු ලැබීම නිසා ව්‍යාපෘති ප්‍රදානය සඳහා ප්‍රමාණවත් කාලයක් නොලැබුණි. | ව්‍යාපෘති සැලසුම් කළ පරිදි ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට හා නිසි කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතු බව. |

### 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව සතු ඉඩම් පිළිබඳව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව දෙපාර්තමේන්තුව සතුව ඉඩම් 45ක් පැවති අතර එයින් ඉඩම් 13 කට හිමිකම් ඔප්පු පැවති නමුත් ඉතිරි ඉඩම් 32 සඳහා හිමිකම් ඔප්පු | හිමිකම් ඔප්පු ලබාගැනීම සම්බන්ධව මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග වශයෙන් මැනුම් සිදුකර මිනින්දෝරු සැලැසුම් සැකසීමටත් ඔප්පු ලබාදෙන ලෙස අදාළ ආයතනයන්ගෙන් ඉල්ලුම් කිරීමටත් කටයුතු කර ඇත. | නිරන්තරයෙන් විමසීම් කර හිමිකම් ඔප්පු ලබා ගැනීමට කටයුතු කළ යුතු බව හා මිනින්දෝරු සැලැස්ම සකස් කර වත්කම් වෙන් වශයෙන් තක්සේරු කර වටිනාකම් දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. තවද ඉඩම් 25 ක් සඳහා තක්සේරු වටිනාකම වෙන් කර හඳුනා ගත නොහැකි වී තිබුණි. | | |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දින වන විට නිල නිවාස 09ක් ඌන උපයෝජිතව පැවතුණි. තවද නිල නිවාසයන් කිහිපයක පැවති අඩුපාඩු හා අළුත්වැඩියා කටයුතු නොකිරීම හේතුවෙන් භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පැවතුණි. | වෙන්කර නොමැති නිල නිවාස පොරොත්තු ලේඛනයට අනුව නව නිලධාරින්ට ලබා දීමට කටයුතු කරන අතර අලුත්වැඩියා කටයුතු කිරීමට ඇති නිල නිවාස අලුත්වැඩියා කිරීමට ඇස්තමේන්තු කර ඇති නමුත් 2022 වර්ෂයේ ප්‍රමාණවත් ප්‍රතිපාදන නොතිබිණි. | ඌන උපයෝජිතව පවත්නා නිවාස ඉතා ඉක්මනින් අළුත්වැඩියා කර උපරිම ආකාරයෙන් උපයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ඇ) | 2020 මාර්තු මාසයේ සිට සංචාරකයන් වෙත තංගල්ල සංචාරක බංගලාව ලබා දී නොතිබුණි. එසේ වුවද නිසි ක්‍රමවේදය යටතේ මුදල් ගෙවා වෙන්කරවා ගැනීමකින් තොරව බාහිර පුද්ගලයන් පිරිසක් සංචාරක බංගලාවේ රැඳී සිටීම හේතුවෙන් ජල හා විදුලි ගාස්තු අසාමාන්‍ය ලෙස වර්ධනය වී තිබුණි. එහෙත් බංගලාවේ නඩත්තු වෙනුවෙන් වියදම් දැරීමට කිසිදු ආදායමක් ලැබී නොතිබුණි. විදුලි හා ජල සැපයුම විසන්ධි කරන ලෙස ලංකා විදුලිබල මණ්ඩලයෙන් හා ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයෙන් 2022 ඔක්තෝබර් 18 දින අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉල්ලුම් කර තිබූ අතර ඒ අනුව 2023 මැයි 24 දින විදුලියද 2023 මැයි 17 දින ජලයද විසන්ධි කර තිබුණි. එසේ වුවද අනවසර පුද්ගලයන් රැඳී සිටී කාලය සඳහා ජල හා විදුලි වියදම වූ රු. 666,447 ක් අදාල පුද්ගලයින්ගෙන් ප්‍රතිපූරණය කර ගැනීමට නොහැකිව තිබූ අතර එය දෙපාර්තුමේන්තුවට පාඩුවක් වී තිබුණි. | මේ සම්බන්ධව අදාළ සියලු පාර්ශවයන් දැනුවත් කර ඇති අතර මේවන විට ජල හා විදුලි සැපයුම් විසන්ධි කර ඇත. | වහාම ජල හා විදුලි වියදම් ප්‍රතිපූර්ණය කරගැනීමට සහ සංචාරක බංගලාව ආදායම් උත්පාදනය කළ හැකි ලෙස මෙහෙයවිය යුතුය. |

## 3.5 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 සහ 2021 වර්ෂයන්හි දී සිදු වූ වාහන අනතුරු දෙකක් සම්බන්ධයෙන් ඇති වූ රු. 89,597 ක් පාඩුව 2022 දෙසැම්බර් 31 දින දක්වාම අයකරගෙන නොතිබුණි. | 2016 වර්ෂයේ සිදුවූ පාඩුව පොතෙන් කපා හැරීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට යොමු කර ඇත. අංක 300 – 4237 දරන වාහනයට සිදු වූ පාඩුව පොතෙන් කපා හැරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | හානි හා පාඩු නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (i) | තිරසර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් තම විෂය පථයට අදාල කාර්යයන් හඳුනාගෙන නොමැත. | 2030 න්‍යායපත්‍රය පිළිබඳව දැනුවත් වී ඒ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ii) | වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | තිරසර අරමුණු යළි හඳුනා ගැනීම 2023 වර්ෂයේ දී කටයුතු ආරම්භ කළ අතර 2023 ජුනි 15ට පෙර එය නිශ්චය කර ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ. | 2030 න්‍යායපත්‍රය පිළිබඳව දැනුවත් වී ඒ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**විගණන නිරීක්ෂණය**

2022 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රුපියල් මිලියන 288 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු. 567,819 ක් වී තිබුණි.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ------ | -------- | --------- | ------------ | ------- |
| | | ස්ථිර | කොන්ත්‍රාත් | |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 126 | 102 | - | 24 |
| තෘතියික මට්ටම | 24 | 05 | - | 19 |
| ද්විතියික මට්ටම | 285 | 270 | - | 42 |
| ප්‍රාථමික මට්ටම | 178 | 128 | 03 | 50 |
| එකතුව | **613** | **505** | **03** | **135** |
| | ==== | ==== | ===== | ==== |

**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**

සේවක පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පත්වීම් බලධාරීන්/ රාජ්‍ය සේවා කොමිෂන් සභාව /රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය/ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව/ බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත.

**නිර්දේශය**

දෙපාර්තමේන්තුව විසින් පුරප්පාඩු පිරවීමට හෝ තනතුරු සංඛ්‍යාව සංශෝධනය කරගැනීමට කටයුතු කළ යුතු බව.